අපේ සඳැඳු මල් අහසේ සෙරිටනා
එකම සලටි ඇස්සෙන් දීගෙන සුදිනා
රෑතු දහ ගෙයක අත් විඳින වේදනා
විරහක වෙන්ගෙම ගිලුණිද අපට නාරකා

කරු කැට සෙද ගත නුහුණුව වැලකෙනා
ලොවක කුරුලු බිළිඳුන් අපි නොගැළපුව
නුග සෙළගෙට ඇහැරුණු දුව දිටිගෙන
මල්ලම් අපෙනුත් සෑ ද්‍රව්‍යන් ලුහුකම

සහ හොළ සවා විකසා ගෙන කහ වියරු
ගැලු මුල අහර හිර වූහ අසරණ හුවරු
කමට හෙත් මිණිය හුම මා වෙත පැවරු
සද්කට ගනිනු කඳුළැලී පැන් ලෙස මිහුරු

පද රචනය : ජගත් ගාමිණී මාවතගෙ.
සංගීත නිර්මාණය : එච්. එම්. ජයවර්ධන.

තුඹත් අසරණ මමත් අසරණ
අහිංසක පෙම්වතුන් වමු අපි
උණුත් විදවා තුමට හඩමුද
කාපුරුෂම් මිල නොගෙන දෙන නගරේ

ගණඳුරු මැදියම් කාටත් රහසින්
ඔබ පෙරමග තනි තරුවක් වෙන්නම්
මාර සෙනග රැගැණිව සොයනා සඳ
ඔබ සඟවන්නට ගණඳුරු වෙන්නම්

රණබිම මැද රුදු රුපුන් නසන්නට
ඔබ සුරපෙති රන් අසිපත වෙන්නම්
විඩාපත්ව අසරණව හිඳින සඳ
තුරුලට ගෙනහිඳ සිඹ සනහන්නම්

පද රචනය : තිලක් පුෂ්පකුමාර
ස්වර නිර්මාණය : විජිත අනුප්‍රිය

'මිනිසාගේ අතිඋතුම් වස්තුව ජීවිතයයි.
එය ඔහුට ලැබෙන්නේ එක් වරක් පමණකි.
අරමුණක් නැතිව ජීවත් වීම නිසා
කටුක වේදනාවක් නොවනයේ
නීච සහ නොවැදගත් අතීතයක් නිසා
ලැජ්ජාවීමට සිදු නොවනයේ
ඔහු ජීවත් විය යුතුයි
ඔහු මිය යන විට ඔහුට මෙසේ කීමට
පුළුවන් කමක් තිබිය යුතුයි
මගේ මුළු මහත් ජීවිතයත්
මුළු මහත් ශක්තියත්
ලෝකයේ අතිශයින්ම උදර හා සුන්දර
පරමාර්ථ උදෙසා
එනම් මිනිස් සංහතියට විමුක්තිය ලබාදීමේ
සටන උදෙසා කැප කරන ලදී'

— නිකොලොයි ඔස්ත්‍රොව්ස්කි

විරූ සිසුවන්ට අපේ උපහාරය..!

අවසන් වසර [1992] සිසුන් පිරිසක්

ගණ අඳුරු මැදියමේ
නුඹ ස්වර්ණ සඳ මඬල වී
අවදි කළ ළිහිණි වෙමි
නුඹ මැරු හැටි දුටිමි

සොයා දඩයම් මිනිස
අසපුවට පැමිණි මගෙ සේනා
කඩා තවු පුග හිස තලා
දෙතිස් වධ පැමිණුවද
හිරං පෝතක නොවූ
වර කෙසර සිහ රදුනි

පාරමී වනු මිනිස
අගාධ නැගෙනා ලෝකයට සතරයේ
මරණයට තුරුළු වූ මහරුවේ
කටුක වූ වසන්තයෙ
කටු අතර මලක් වූ
නුඹ සැබෑ විරු සොයුර

පද රචනය : තිලක් පුෂ්පකුමාර
ස්වර රචනය : විශාරද ගුණදාස කපුගේ.

නැවුම් දිනකට දෙතෝරාවයි
මසිත අවදිව හිඳින්නේ
කවුළුපත් හැර එබී විමසමි
රුහැයියනි ඇයි අඬන්නේ

නිමල හදවත නිසල වනගැබ
දුවි වැතිරුණ වෙලාවේ
වගුළ දහයක් කඳුළු බිඳුවල
සිහිල දෝ මේ දනෙන්නේ

එද බියවූ කුරුළු බිළිඳුන්
තාම තිගෙනත් අඬන්නේ
උන්ගෙ කඳුළුද තුරු මුදුන් පිස
බිඳින් බිඳ මේ ගලන්නේ

පද රචනය : ජගත් ගාමිණී මාවතගම
ස්වර නිර්මාණය : විශාරද සුනිල් සමරසිංහ

ප්‍රදර්ශනය නැරඹූ පසු ඔවුන්ගේ හදවතින් නැඟුණු සිතිවිලි මෙසේ සටහන් වී තිබිණි

දරුව,

අයුක්තියට අසාධාරණයට විරුද්ධව ජනතාව දැනුවත් කිරීමට තව තවත් ඉදිරියට යන්න.

පියෙක්

ඔබේ දිවිය අපට සවියකි. - කම්කරු සොයුරෙක්

සේවක අපගේ අයිතීන් පවා දිනාගැනීමට උරදී දිවිපිදූ වීරුවනි, අපි ඔබ සද සමරමු.

සේවක සහෝදරයෙක්.

නිදහස් නිවහල් ස්වෛරී රටක් වෙනුවෙන් කම්කරු අයිතීන් සිසු අයිතීන් වෙනුවෙන් විරෝධාර ලෙස ජීවිත පරිත්‍යාග කළ අපේම සිසු සොයුරු සොයුරියන් සිහිගන්වා ඔවුනට කළ උත්තමාචාරයට අපි ගෞරව කරන්නෙමු. සතුටු විය යුතු අතීතයක් අපට නොමැත. රතු ලෙයින් ගලාගිය කඳුළු පිරුණු අතීතයකින් අනාගතයට පිය මනින අපි ඔබලා සමඟ අත්වැල් බැඳගෙන මේ අසිරු වූ ගමනට ශක්තිය හා ධෛර්යය ලබා දෙන්නෙමු.

කඳවුරකින් නිදහස්ව පැමිණි සොයුරෙක්.

ඔබ විශ්ව විද්‍යාලය තුලින් අප සැමට මේ චිත්‍ර ප්‍රදර්ශනය තුළින් ඇති කළ අපගේ උදර චිත්ත ධෛර්යයට ඔබ සැමට අපේ සුබ පැතුම් සමග සහාය.

ගුරු විද්‍යාලය - රත්මලාන.

ඉතින් දයාබර සොයුර සොයුරියනි
අපේ අද දවස වෙනුවෙන්
ඔවුන්ගේ ඊයේ දවස ඩිලිකර තිබුණි.
දුටු සැම දේ සිතේ ඉතිරිකළේ ශක්තියත් වෛරයත් පමණි.

සම්බුද්ධදේව් සිසු පිරිසක්.

සොයුරනේ, හෙට අපි එන්නම් ඔබ හා අත්වැල් බැඳගන්නට.

ධර්මපාලියන් දෙදෙනෙක්

ලංකාවේ සැම සරසවියකම මෙම ප්‍රදර්ශනය පවත් වන්න. සරසවි සිසුන් අතර පමණක් නොව පාසැල් සිසුන් අතරටද සටන් ගෙනයන්න. පුළුල් ජනතා ක්‍රියාදමයන් තුලින් ජාතික ප්‍රශ්න වලදී ක්‍රියා කරන්න.

කොළඹ රාජකීය විද්‍යාලයේ සිසුවෙක්

රෑතට දිලා ඉඳ සඳත
විදුලියට මිරිකෙනවා
ගැටිලා තිබිලත් මිය
නිහඬ මිහි ගැඹුරට

අහස් කැරැලි ඉරිම ගමන
මිට පි පුරුකුරක්
පුම්බලා දුක ගෙනා
පාගම් පුරාවා

දුම් කුලුලු නටන පුී
ඇග ගහක් මල් කැකුළු
විදුලියේ ගෙට් කැන්ගෙන්
යළි යළිත් පිපෙනවා.

ඇඹු මිතුරනි අපේ
හුසිලා අනුරුද්ධපෝෂකරු
අනුස්මිය අප වගෙන්
නිහඬ කැපී සටනට

සිතල වූ මරණයෙන්
නැඟිටලා එතෙරන් යළි
පිළිගන්න අප නාම
මග බලා සිටිනවා

රංජිත ශ්‍රීලාල්
නිමල් වීරසේකර
දයාරත්න වෙනුවෙන්

රාජ්‍ය පරිපාලන විද්‍යා අවසාන වසර සිසුන්

ඇල් මැලැවුණු හේමන්තය
හිරි වැටුණු වසන්තය
සුසුම්වා පැන තැවුණු
මිට අඹල ශ්‍රී මය දන්ල
හිසල කඳුළු මම දන්ල
හදය කෝමා සහ දන්ල
සුදුසු උපහාරයෙන්
කම්පනා හැඟුමින් - උණුසුම් හදවතින් ....
විරුසිසු කමුත උපහායට අපගේ ප්‍රණාමය!

රාජ්‍ය පරිපාලන දෙවන වසර සොයුරු සොයුරියන්

සොයුර ඔබ මියැදුනේ
ඔබ වෙනුවෙන් නොව
අප වෙනුවෙන්ය.
ඒ මාවතේ අපිද
සත්‍යය වෙනුවෙන් මියනගන්නෙමු

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
බෞද්ධ ශික්ෂාචාරය විශේෂ 1 වසර සිසුන්

ලේයින් කඳුලින් දේශය
සුවඳවත් කළ
විරු සිසු සොයුර
ඔබ මරා දමුවද
ඔබ නැගූ හඬ
සදා ජීවමානයයි
ඒ ඔබේ හඬවිටා
මෙසේ පෙළ ගැසෙන්නෙමු
පිබි කරන්න
නව ලෝවක්
අද දිනේ ....

ඔබ හා සහෝදරයින් මැදුණ
11 වසර ශිෂ්‍යභාවිතයන්ගේ සිසුන්

කඩා තැලූ යුග - ඉරා හදවත
මළානික කොට - ස්වර්ණ ඥනයන
මරා දැමූ මංග - සරා සඳ සරි
පරෙවි දරුවන් - නිසා ඉකි ලමි

දෙපෙති සලා සුහුඹුල්ව වැඩී එන
කුමුළ වනස්පති සේ
පුතුනි නුඹෙ මූව රුදම නොමවිදෝ
නුඹට එරෙහි වූයේ

මපුතු මරාදමූ නමුදු වසන්තය
නිමල මලින් සැරසී
දිනෙක සිනා සෙන විටෙක අසන්නෙමු
නුඹෙ ස්වර්ණ රාවෙ

පද රචනය - ජගත් ගාමිණී ළාවතගම
ස්වර නිර්මාණය - විශාරද නන්දා මාලනී

ප්‍රේමියේ නාමයෙන්
අවම ඇත් මත වියැලි
සොඳුර මතක විරු සුවඳ
පියෝසෙනු සළිදු අප
රතු රෝස සුනුම මත

15 විමලධර්ම නේවාසිකාගාරය

කඳුළක් සෙවිනේ සොයොයාය සැනසුන
දුක උලෙලුවා තිරුවින් කළ මුව
සුරත් පැතැය ගෙන විපුල රුහිරු මත
සමිඳ අපේ පෙර මග ලියැවී ඇත

විද්‍යෝදයෙන් සමුගත් ආදි ශිෂ්‍යයෙන්